# දැන්වීමයි

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# නැගෙනහිර පළාත

## නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024

උක්ත කරුණට අදාලව 2024.03.22 දිනැතිව මවිසින් "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළකළ දැන්වීම් හා නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීම සම්බන්ධයෙනි.

ඒ අනුව අදාල දැන්වීමෙහි "උපලේඛන 1" යටතේ "විෂය අංක 01"ට අදාලව පහත සංශෝධනය සිදුකරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**සංශෝධනය**

| විෂයය අංකය | මාධ්‍ය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 01 | සිංහල හා දෙමළ | ප්‍රාථමික (Primary) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල / දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති (සාමාන්‍ය/විශේෂවේදී) ශාස්ත්‍රවේදී උපාධිය<br><br>හෝ<br><br>කලා විෂය ධාරාව යටතේ සාමාන්‍ය/විශේෂ උපාධියක් සමග අ.පො.ස. උසස් පෙළ විභාගයේදී සිංහල/දෙමළ විෂයය සමත්ව තිබීම |

එසේම මෙම පුවත්පත් දැන්වීමට අදාලව බඳවාගැනීම් සිදුකරනු ලබන්නේ 2023.08.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අංකඃ අමප/23/1537/607/124 හා 2023.09.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු සඳහා පමණක් වන බවද එම පුරප්පාඩු ප්‍රමාණය නැගෙනහිර පළාත තුළ පවතින සමස්ත ගුරු පුරප්පාඩු ප්‍රමාණය නොවන බවද මෙයින් දැනුම් දෙමි.

අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය **2024.04.15** දින දක්වා දීර්ඝ කරන බවද වැඩිදුරටත් දන්වමි.

එසේම නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද බඳවාගැනීම් දැන්වීමෙහි සඳහන් අනෙකුත් කොන්දේසි එලෙසින්ම බල පැවැත්වේ.

**ඒ. මන්සූර්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**2024.04.02**